ලක් ඉතිහාසයේ සඳහන් වීර කාන්තා චරිත අතරින් සෝමා දේවියට හිමිවන්නේ අග්‍රගණ්‍ය ස්ථානයකි. දකුණු ඉන්දීය ද්‍රවිඩ ආක්‍රමණිකයන් අප රට ආක්‍රමණය කළ අවස්ථාවේ රට කර වූයේ වළගම්බා මහ රජුන් බව මහා වංශය සඳහන් කරයි. එකී ආක්‍රමණය බලවත් වූයෙන් පසුබැසීමට සිදුවිය. එකී අවස්ථාවේදී සෝමා දේවිය රථයෙන් බැසීමට ගත් නිර්ණිත තීන්දුව නිසා වළගම්බා මහ රජුන්ගේ දිවිය සුරක්ෂිත විය.

ඓතිහාසිකව තීරණාත්මක සංසිද්ධියක් වූ මේ සිදුවීම වූ ස්ථානයේ වළගම්බා මහ රජුන් විසින් තම දේවිය සිහිපත් වනු පිණිස ස්තූපයක් සහිත විහාරයක් කරවීය. මෙහි සෝමා දේවිය විසින් බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් පූජා කරන ලද සිය රන් ආභරණ ඇතුළු පූජා භාණ්ඩ වළගම්බා මහ රජුන්ගේ රන් ආභරණ ඇතුළු පූජා භාණ්ඩ තැන්පත් කර ඇති බව කියැවේ. එමෙන්ම බුදුන් වහන්සේගේ පඩි ධාතුවෙන් කොටසක්ද මෙහි තැන්පත් කර ඇති බවට ජනවහරෙහි සඳහන් වේ. වර්තමානයේ ලංකාරාමය ලෙස හැඳින්වෙන්නේ මෙකී විහාර භූමියයි.

වර්තමානයේ හැඳින්වීම එසේ වුවද වංස කතා පරිශීලනය කිරීමේදී වළගම්බා මහ රජුන් විසින් කරවන ලද අටමස්ථානයන්ගෙන් එක් ප්‍රමුඛස්ථානයක් ලෙස ලංකාරාමය සලකන්නේ එබැවිනි. මෙතරම් වැදගත්කමකින් යුක්ත වුවද මේ දක්වා ලංකාරාමය පිළිබඳව සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් ජනගත වී නොමැත. එයට හේතුව ඒ පිළිබඳව තරමක ගැඹුරු අධ්‍යයනයක් මෙතෙක් සිදුවී නැති බැවිනි. එසේ වුවද වසරක පමණ කාලයක් සිදු කළ ශාස්ත්‍රීය ගවේෂණයක් මඟින් මෙතෙක් සම්ප්‍රගත වී තිබුණු පුළුල් තොරතුරු සමුදායක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය තුසිත මෙන්ඩිස් සහිත ලක්ෂණවලින් යුක්ත සඳකඩපහණ් ලංකාරාමයේ නොමැති බව කිව යුතුය.

ලංකාරාමයේ ඇති මුරගල් සැලකූ විටද මුළින්ම කැටයම් රහිත උඩින් පොඩි ගැටියක් සහිත මුරගල් තිබෙනවා. එසේම "නාගරාජ" මුරගල්ද මෙහි පවතී. මෙහිලා එතරම් විකාශයක් සිදු නොවුණත් මූලික වශයෙන් ගොඩනැඟිලි සංවර්ධනය වන තත්ත්වයක් යටතේ මෙකී වෙනස්කම් ඇති වී ඇති බව මහාචාර්ය තුසිත මෙන්ඩිස් පැවසීය. කොරවක් ගල් සම්බන්ධවද තත්ත්වය එසේමය.

රජරට යුගයෙන් පසු එවකට එහි විසූ ජනයා යම් මට්ටම්වලින් ලංකාරාමය නඩත්තු කර පවත්වාගෙන ගොස් ඇත. රාජ්‍ය අනුග්‍රහය ඇතිව මහා පරිමාණ නඩත්තු කිරීම් කිරීමට හැකියාවක් නොපැවැති බව පෙනේ. ලංකාරාමය පිළිබඳව ලිඛිත වාර්තා ආරම්භ වන්නේ 1984 වර්ෂයේ බ්‍රිතාන්‍ය ජාතික ජී. ජී. ස්මිර් විසින් සිදු කරනු ලැබූ වාර්තා සමඟය.

කෙසේ වුවද ලංකාරාම චෛත්‍ය ප්‍රමුඛ විහාරය සංරක්ෂණය කිරීම පටන් ගනු ලබන්නේ 1940 දශකයේ මුල් භාගයේදී ය. එවකට ආණ්ඩුකාර ජෙනරාල් ලෝඩ් සෆලී ප්‍රමුඛ පිරිස ලංකාරාමයට පැමිණ ඇති බව වාර්තා වේ. ඒ අනුව 1940 දී පමණ ලංකාරාමය සංරක්ෂණය කිරීම සඳහා ඉන්දියාවේ සිට ඉංජිනේරුවරු පිරිසක් ගෙන්වා ගෙන ඇති බව ද වාර්තා වේ.

1940 දී පමණ ලංකාරාමය සංරක්ෂණය කිරීම සඳහා ඉන්දියාවේ සිට ඉංජිනේරුවරු පිරිසක් ගෙන්වා ගෙන ඇති බව ද වාර්තා වේ.



නාගපෙන හතක් සහිත දිසාපාලක රුව එකතු වූ මුරගල







පඨානඝරය

ලංකාරාමය හැදුවේ භික්ෂුණීන් වෙනුවෙන්ම ද?

කාන්තාවන්ට හැදුනු වැසිකිළි පද්ධතියක්

චීනයට භික්ෂුණීන් උපසම්පදාව රැගෙන ගියේ ලංකාරාමයෙන්

සෝමා දේවිය දිවි පරදුවට තැබූ තැන



"සිලාසොබිබකණ්ඩක චේතිය" නමින් වූ චෛත්‍යයක් පිළිබඳව මහා වංශයේ සඳහන් වේ. එමෙන්ම කනිට්ඨතිස්ස මහ රජුන් මනිසෝමාරාමය නම් චෛත්‍ය වටා ථූපඝරයක් කරවන ලද බවද මහා වංශයේ කියැවේ. එමෙන්ම බෝධි වංශ ගැටපදයේද මනිථූපාරාමය නම් චෛත්‍යයක් පිළිබඳව සඳහන් වේ. මේ ආකාරයට හැඳින්වෙනුයේ වර්තමානයේ ලංකාරාමය ලෙස හඳුන්වන චෛත්‍යයම බව මහාචාර්ය ටී.ජී. කුලතුංගයන්ගේ අදහසයි.

මෙය ලංකාරාමය ලෙස හඳුන්වනු ලබන්නේ සොළී දේශයට රැඟෙන ගිය සෝමා දේවිය යළි රැගෙන එම නිසා ලංකා දේවිය ලෙස හැඳින්වූ බවත් ඒ හේතුව නිසා මෙකී විහාරය පසුව ලංකාරාමය ලෙස හැඳින්වූ බවටත් ජනප්‍රවාදයක් පවතී.

කෙසේ වුවද රජරට රාජධානිය නිරිත දිගට සංක්‍රමණය වීමත් සමඟම අනුරාධපුර රාජධානිය අභාවයට යෑම හේතු කොටගෙන ලංකාරාම භූමියටද අත් වූයේ සෙසු පූජනීය ස්ථානවලට අත් වූ අභාග්‍යසම්පන්න ඉරණමය. එවන් වටපිටාවක එවකට රජරට ජනයා තමන්ට හැකි ආකාරයකට ලංකාරාම පුණ්‍ය භූමිය ආරක්ෂා කළද බ්‍රිතාන්‍ය පාලන සමය වන විට රාජ්‍ය මැදිහත් වීම මත යම් යම් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවන්නට විය. එලා සිට වර්තමානය දක්වා වරින්වර ලංකාරාම ගවේෂණ කටයුතු සිදු කරන ලදී. මේහිදී මහාචාර්ය ටී.ජී. කුලතුංග, ආචාර්ය හෙට්ටි ආරච්චි වැනි විද්වත්හු ප්‍රමුඛස්ථානයක් ගනිති.

කෙසේ වුවද පුරාවිද්‍යාඥයන් බහුතරයකගේ අදහස වන්නේ ලංකාරාමය යනු අභයගිරියටම අයත් භික්ෂුණීන් වහන්සේට අදාළ වන්නා වූ මෙහෙණි ආරාමයක් බවයි. ලංකාරාම විහාර භූමියේ උතුරු දෙසින් අභයගිරි විහාරයට ගමන් කළ හැකි දොරටුවක් අද්‍යටත් පවතී.

සාපේක්ෂ වශයෙන් සැලකූ විට ලංකාරාමය යනු කුඩා විහාරස්ථානයකි. එය එසේ වුවද මහා විහාරයකට අවශ්‍ය පූජනීය අංගයන් වන ස්තූපය, බෝධිය, පිළිමගෙය, පෝයගේ මෙන්ම වැසිකිළි කැසිකිළිවලින් යුක්ත නේවාසික ගොඩනැඟිලිවලින්ද සමන්විත විය. ඒ අනුව ලංකාරාමයද මහා විහාරයක් බව පුරාවිද්‍යාඥයන්ගේ මතයයි. වර්තමානයේ පවා අනුරාධපුර සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ශ්‍රෂ්ඨාමලී ගුණරත්න මහත්මිය ලංකාරාම විහාරාධිකාරී රළුපනාවේ ධම්මජෝති හිමියන්ගේ අනුශාසකත්වයෙන් ග්‍රන්ථයක් මේ වෙන විට එළිදක්වා ඇත.

ලංකාරාම විහාර භූමිය ප්‍රමාණයෙන් කුඩා වුවද මෙය මහා විහාරයක සැලැස්මට අනුව ඉදිවූ සියලුම පූජනීය අංග මෙන්ම නේවාසික ගොඩනැඟිලිවලින්ද යුක්තය. ඒ අනුව මෙය විහාරයක ප්‍රමුඛම අංගය වන චෛත්‍යය මෙන්ම බෝධිය, පිළිමගෙය සහ පොහොය ගෙය යන පූජනීය අංග මෙන්ම වැසිකිළි කැසිකිළි පද්ධතිවලින්ද යුක්ත අංගසම්පූර්ණ විහාරයකි.

"අපි මෙහිදී විහාරස්ථානයේ සැලැස්ම ගවේෂණය කළා. මේ විහාරයේ පවතින්නෙත් මහා විහාරයක ලක්ෂණම තමයි. නමුත් අශෝකාරාමය, මිහින්තලයේ අනුරා චෛත්‍ය ප්‍රමුඛ විහාර වශේම භික්ෂුණී විහාරයක් හැටියට තමයි මෙය අපට පැහැදිලිව පෙනී ගියේ. මෙහි ස්තූපය කේන්ද්‍ර කරගෙන විහාරස්ථානය ගොඩනංවලා තියෙනවා.





බෝධිඝරයේ ශේෂිත කොටසක්

ලංකාරාමයේ ගඩොල් ගෙවල් හදන්න අරන්

උතුරින් අභයගිරියට දොරටුවක්

ඒ වශේම ස්තූපය වටා විවෘත භූමියක් පවතිනවා. ස්තූපයෙන් බටහිර පැත්තේ වූ බෝධිඝරය ස්තූපයට ළංව ඉදිකර තිබෙනවා. ඒවගේම පිළිමගෙය, පොහොය ගේ යන පූජනීය අංගද පවතිනවා.

මෙහි වටිනාම අංගයක් තමයි පධානඝරය. (භාවනා යෝගී භික්ෂූන් වහන්සේ හා භික්ෂුණීන් වහන්සේ වැඩ වාසය කළ ස්ථාන) තියෙනවා.

මහාචාර්ය තුසිත මෙන්ඩිස් වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින් එසේ පැවසීය.

ලංකාරාමයේ ඇති විශේෂත්වය වන්නේ එය මෙහෙණි ආරාමයක් වූ නිසා බව අපි මුලින්ම සඳහන් කළෙමු. මෙය වඩාත් සනාථ වන කාරණයක් පිළිබඳව ගවේෂණය කළ මහාචාර්ය තුසිත මෙන්ඩිස් මෙසේ පැවැසීය.

"ඇත්තටම ලංකාරාමයේ වැසිකිළි කැසිකිළි පද්ධතිය අනෙක් විහාරාරාමවල ඇති ඒවාට වඩා වෙනස්. ඒවා සකස් වෙලා තියෙන්නේ කාන්තාවන්ට ගරිර කෘත්‍ය සිදු කර ගැනීමට හැකි වන ආකාරයටයි. මෙකී කාරණා අනුව ලංකාරාමය මෙහෙණි ආරාමයක් බව වඩාත් තහවුරු වෙනවා.

අනෙක් වැදගත්ම කාරණය තමයි අභයගිරි මහා විහාරයේ සිට චීනයට උපසම්පදා කර්මය භික්ෂුණීන් වහන්සේ වෙනුවෙන් රැගෙන ගිය බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වෙනවා. එසේ එම භික්ෂුණීන් වහන්සේ වන්නේ ලංකාරාමයේ වැඩ විසූ භික්ෂුණීන් වහන්සේම බවයි සලකන්නේ"

ලංකාරාමය සැලකූ විට එහි විහාර අංගෝපාංගවල අලංකාර අංගයන්ද අන් විහාරයන් සේම පවතී. එහි "සඳකඩපහණ" සැලකූවිට එය මුලින්ම සකසා ඇත්තේ පාටිකයක් (හතරැස් ගල් පුවරුවක්) ලෙසය. පසුව කැටයම් යොදා අලංකරණ අංග දක්වා වර්ධනය වී විකාශය වීමක් දක්වා ලංකාරාමයේ සඳකඩපහණ ක්‍රමානුකූලව දියුණු තත්ත්වයකට පත්වී ඇත. එසේ වුවද අභයගිරිය තරම් දියුණු කැටයම් වෙනස්වීම් ඇති වන තත්ත්වයක් හටගන්නවා. ඒ වගේම ගොඩනැඟිලි ඉදිකළාට පස්සේ ඇති වන සිරස් සහ තිරස් පීඩනය නිසා විනාශකාරී තත්ත්වයක් ඇතිවෙන්න පුළුවන්. අනෙක මෙහි ප්‍රාකාරවලින් වටවී පවතින නිසා නිසි ජල කළමනාකරණයක් සිදු නොවී පසුව ගොඩක් වෙලාවට ඇතුළෙ වතුර රැඳීම නිසා භූ පෘතමනය ඇති වී විනාශකාරී බලපෑමක් ඇති වුණා වෙන්න පුළුවන්.'

මෙවන් සාධකවලින් තොරව මානව ක්‍රියාකාරකම් නිසාද අපගේ පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ වන තත්ත්වයක් ඇති වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඒ අනුව ලංකාරාම විහාර භූමිය සැලකූ විටද එහි තිබූ ගල් සහ ගඩොල් රැගෙන ගොස් මාර්ග සහ නිවාස ඉදි කර ඇති බැව් පෙනෙනවා.

මෙවන් පසුබිමක ලංකාරාමයේ බොහෝ විහාර අංගෝපාංග මේ වන විට යම් යම් මට්ටම්වලින් සංරක්ෂණය කර තිබුණද මෙහි පොකුණුවල කිසිදු සංරක්ෂණයක් සිදු කර නොමැත. ඒ පිළිබඳව බලධාරීන්ගේ අවධානයද යොමු විය යුතුය.

බටහිර නිර්ණායක අනුව කුමන මට්ටමේ ප්‍රතිසංස්කරණ සිදුකළද අපගේ පුරාවස්තූන් සේම මෙම පූජනීය වස්තූන්ද පූජනීයත්වයෙහිලා සැලකීම මඟින් අපේ උරුමය සහ එහි අනාගත සුරක්ෂිතභාවය වඩාත් තහවුරු වන බවද අවධාරණයෙන්ම කිව යුතුය.

එමෙන්ම ලංකාරාම පුණ්‍ය භූමිය බොහෝ දෙනා නොසිතුවද අප රටේ තීරණාත්මක කාලවකවානුවක හැරවුම් ලක්ෂයක් වී පැවැති බව පෙනේ. අප එසේ පවසනු ලබන්නේ සෝමා දේවිය තම දිවි පරදුවට තබා මහ රජුන්ගේ දිවි ආරක්ෂා කිරීම හේතුකොටගෙන රජු දුවිඩ සතුරන් අතට පත් වීමට තිබූ අවස්ථාව සම්පූර්ණයෙන්ම මඟහැර ගියේය. ඒ නිසා යළි මුළුමහත් දේශයම එක්සේසත් කිරීමට සෝමා දේවියගේ වීර ක්‍රියාව නිසා වළගම්බා මහ රජුන්ට හැකි විය. තම ජීවිතයද නොතකා එවන් අපරිමිත කැප කිරීමක් කළ සෝමා දේවියගේ නම ඉතිහාසයේ රන් අකුරින් සටහන් වන බව අවසන් වශයෙන් සඳහන් කළ යුතුය.









කැසිකිළි හා වැසිකිළි සංකීර්ණය

■ ප්‍රසාද් ධනුෂ්ක ගුණසිංහ
Prasadgunasinghe@gmail.com